# යුද්ධාලම්බන ප්‍රීතිය



දැයට ඉදිරි මග පෙන්වමින්

බහුතරයක් බෞද්ධයින් වෙසෙන ශ්‍රීලංකාව වැනි රටක පන්සලක, විහාරයක, සෑ මළුවකදී බෞද්ධ සැදැහැවතුන්ගේ සිතෙහි බුදුන්වහන්සේ අරමුණුකරගෙන ඇතිවන සතුට බුද්ධාලම්බන ප්‍රීතිය යනුවෙන් හැඳින්වේ. දුරුතු පොහෝදා කැළණිවිහාරයට හෝ වෙසක් දිනයේ අප රටේ ඕනෑම විහාරස්ථානයකට හෝ ගොස් වන්දනාමාන කරන සැදැහැවතුනගේ සිතෙහි ඇතිවන නිරාමිස සතුට ඒ බුද්ධාලම්බන ප්‍රීතියමය. සාදුකාර දීමෙන් ප්‍රකාශ කෙරෙන්නේද ඒ සතුටමය.



මෙම විශේෂ වූ සන්තෝෂය බොදු සැදැහැවතුනට පමණක් වෙන්වුව ද බෞද්ධ අබෞද්ධ සෑම ශ්‍රී ලාංකිකයෙකුටම නොඅඩුව භුක්තිවිඳිය හැකි සතුටක්, ප්‍රීතියක් මේ අද දවසේ ශ්‍රී ලංකාවේ බහුතරයකටද, දේශ දේශාන්තර වල වෙසෙන දේශ ප්‍රේමී ලාංකිකයන්, විශේෂයෙන් සිංහල ජනතාව තුළද පහළවී තිබෙන බව මට කල්පනා විය. ශ්‍රීලංකාවේ පුරා අවුරුදු 25 ක් තිස්සේ පැවති පීඩාකාරී හිංසාකාරී කටුක වාතාවරණයෙන් මිදීයමින් පැවතුණු ඒ බිහිසුණු යුදමය තත්වය විජයග්‍රාහී විලාශයෙන් අවසන්වන්නට යන බව පෙනිපෙනී අප සිත්හි උපදිනාලද සහනය, සැහැල්ලුව, සංතෝසය යුද්ධාලම්බන ප්‍රීතිය යනුවෙන් හැඳින්වීම කවර වරදක්ද?

විදෙස්හි ජීවත්වන සිය මව්බිමට ආදරය කරන ශ්‍රීලාංකිකයින් දෙමළ කොටි ත්‍රස්තවාදය හෙළාදකිමින් ලෝකයාට කොටි සංවිධානයේ සැබෑ ස්වරූපය පැහැදිලි කිරීමට පෙළපාලියමින්, උද්ඝෝෂණ කරමින්, අපගේ වීරෝදාර සන්නද්ධ සේනා නිරතව සිටින සටනට විවිධ අයුරින් සහාය දෙමින් යුද්ධාලම්බන ප්‍රීතිය භුක්ති විඳින අයුරු විදහාපාන පුවත් හා පින්තූර ලොව දසදෙසින් මොහොතින් මොහොත ගලා එමින් පවතී. පරිගණක තාක්ෂණය තුළින් ඒ සතුට විශ්වය පුරා බෙදා හරින සැටිද අපට පෙනේ.

වසර 30 කට ආසන්න වෙමින් පවතින කොටි ත්‍රස්තවාදයත්, උන්ගේ ඊළම් සිහිනයත් සුණුවිසුණුවී යමින් උන් බලහත්කාරයෙන් අල්ලාගෙන සිටි පෙදෙස් උන්ගෙන් මුදාගනිමින්, ත්‍රිවිධහමුදා රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් යුතුව මේ ගිය ගමනේ අවසාන ඉලක්කයටම දැන් ළඟාවී ඇත. ඒ පුවත් අප සැමගේ සිත්සතන්වලට සැනසුම් සුවය දනවන්නකි. කොටි ත්‍රස්තවාදීන් අප රට ඉතිහාසය විකෘතිකර, ලංකා සිතියමද වෙනස් කළේ ඔවුන්ගේ මතු පරම්පරාවලටද ඔබින විදියටය. මංකොල්ලකාරයින් ලෙස දකුණු ඉන්දියාවෙන් ආ ද්‍රවිඩයන්ට ඔතරම් දේවල් ලංකාව තුළ කරන්නට හැකිවුණේ සිංහල ජනයාගේ හොඳහිත නිසාය. ත්‍රස්තවාදීන්ට උවමනා කළේ සිංහල නමැති ජාතියක් ලෝකයේ නොතිබූ අන්දමට ඉතිහාසය වෙනස්කර ලිවීමටය. එහෙත් දැන් පැරණි ලංකා සිතියම දිනෙන් දින ශ්‍රීලංකා හමුදාවන් ඉදිරියට යාමත් සමග යථා තත්වයට පත්වන බව අපට පෙනේ. මේ සියල්ලටම මූලික හේතුව ශ්‍රීලංකාවේ ඒකීයභාවය රැකගැන්මේ අවශ්‍යතාව වෙන කාටත් වඩා වත්මන් ජනාධිපතිවරයාට ප්‍රත්‍යක්ෂවීම නිසායයි සඳහන් කිරීම සම්පූර්ණ සත්‍යයකි.



යාපනයේ සිට නුවරට එන A 9 මාර්ගය යළි විවෘත වූ මොහොත

පසුගිය වසර 25 මුළුල්ලේ ශ්‍රීලංකාවේ බලයටපත් දේශපාලනඥයින්ට, කොටි ත්‍රස්තවාදය ළපටි වියේදීම කරටියෙන් අල්ලා කඩා සුන්කර දැමීමට හැකියාව තිබුණද ඔවුන් එය වර්ධනය වන්නට ඉඩහැරියා මිස කිසිදු හරි පිළියමක් කළේ නැත. කොටි ලෝකයේ වෙනත් කිසිදු ත්‍රස්තවාදී සංවිධානයකටත් වඩා ඉදිරියට ගොස් උන්ගේම ත්‍රිවිධ හමුදාවක් සාදා ගන්නා තත්වයටත් ඉබේම පත්විය. අපේ මොට්ට දේශපාලනඥයින් රාජ්‍ය පාලනයට පත්වුනාට බුද්ධියක් නැතිකම නිසා ද, පාලනයෙහි අදක්ෂකම නිසාද අඳුරේ අතපත ගෑවා මිස රටේ ප්‍රධානම ප්‍රශ්නය වූ ත්‍රස්ත වාදය නසන පිළිවෙලක් ගැන කල්පනා කළේ නැත. සමහර නායකයන් කොටි ත්‍රස්තවාදය පෝෂණය කළා පමණක් නොව එයින්ම ජීවිතක්ෂයටද පාත්‍රවූහ.

ගතවූ කාල පරිච්ඡේදය මුළුල්ලේ ශ්‍රීලංකාව තුළ සිදුවූ සියළු සිදුවීම් මනාව අධ්‍යනයකළ වර්තමාන ජනාධිපතිතුමා සැබෑ රුහුණු පුත්‍රයෙකුගේ ගාම්භීරත්වය විදහා දක්වමින් දෙමළ කොටි ත්‍රස්තවාදය ශ්‍රීලංකාවෙන් සදහටම තුරන් කරදැමීමට අධිශ්ඨාන කර ගැන්ම සැබැවින්ම රටේ හා ජාතියේ පිනට සිදුවූවකි. ජාත්‍යන්තර වශයෙන් කොතෙක් බලපෑම් ආවත් එතුමා ඒකිසිවක් තඹයකට නොසලකා, එකම ස්ථාවරයක පිහිටා, කොටි ත්‍රස්තවාදය සුන්කර දමා එකම ධජයක් යටතේ එකම රටක් නැවතත් ස්ථාපිත කිරීමට තීරණය ගැනීම ගැන මුළු ජාතියම එතුමාට ණයගැති විය යුතුය.

එසේම එතුමා ගේ නායකත්වය පෙරදැරි කොට රට විපතින් මුදා ගැන්මේ භාරදූර කර්තව්‍යයේ යෙදී සිටින ආරක්ෂක ලේකම්තුමා, හමුදපතිතුමා ප්‍රමුඛ හමුදා නායකයින්, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බළ ඇනිය, ඇතුළු යුද පෙරමුණේ සටන් වැද සිටින සියළු රණවිරුවන්ද, මෙතෙක් යුධබිමේදී ජීවිතක්ෂයට පත්වූ හා ආබාධිත රණවිරුවන්ටත්, එවැනි වීරෝදාර දූ පුතුන් අප මාතෘභූමියට බිහිකළ දෙමාපිය වරුන්ටත් සෑම ශ්‍රීලාංකිකයෙකුගේම ප්‍රණාමය ගෞරවය නිබඳව හිමිවිය යුත්තේ ය.

♦ විල්ෆ්‍රඩ් පෙරේරා
Berkshire UK





